**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවලන්තිය සහ 18 වන වගන්තිය යටතේ පවරා ඇති 2003 අංක 01 දරණ ජෛව රසායන , අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි ඡේද අංක 70 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, ජංගම වත්කම් සහ ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර දැක්විය යුතු වුවත්, වර්ෂයක කාලයක සිට වර්ෂ 10 කට වැඩි කාලපරාසයක් තුළ පැවති එකතුව රු.51,576,257 ක්වූ ස්ථාවර තැන්පතු සහ එකතුව රු.3,373,969 ක් වූ සේවක ණය ශේෂයන් සම්පූර්ණයෙන්ම ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර තිබුණි. | ස්ථාවර තැන්පතු වර්ෂයකට වඩා වැඩි කාලයක් පැවතුනද ආයතනයට මුදල් අවශ්‍ය කුමන මොහොතේදී හෝ ස්ථාවර තැන්පතුව අවලංගු කොට මුදල් ලබා ගත යුතු වේ. තවද සේවක ණය මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර හා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර 2020 අවසන් ගිණුම් පිළියෙළ කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) 2019 ජුනි 04 දිනැති අංක 05/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව 2019 ජුනි 01 දින සිට බල පැවැත්වෙන පරිදි පාරිතෝෂිත දීමනාව ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව සහ මාසික හිලව් දීමනාව ඇතුළත් කර තිබීමෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව පාරිතෝෂිත දීමනා සඳහා වූ වාර්ෂික වියදම රු. මිලියන 12.4 කින් එනම් සියයට 1769 කින්ද, පාරිතෝෂිත සඳහා වූ වෙන්කිරීම් රු. මිලියන 13.1 කින් එනම්, සියයට 181 කින්ද වැඩි වී තිබුණි. නමුත් මෙ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා | 2020 අවසාන ගිණුම් පිළියෙළ කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තු හා දෝෂවල වෙනස්වීම්" හි 44 වන ඡේදය ප්‍රකාරව අදාළ අනාවරණ කිරීම් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව අවශ්‍ය අනාවරණ කිරීම් ගිණුම්කරණ සටහන් මඟින් ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 “ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තු හා දෝෂවල වෙනස්වීම්” හි 44 වන ඡේදය ප්‍රකාරව අදාළ අනාවරණය කිරීම් සටහන් මඟින් ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 13 ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණ නිර්වචනයට අනුකූලව සහ 14 වන ඡේදයේ සඳහන් දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීමට යටත්ව මෙම ආයතනය පවත්නා ගෙන යනු ලබන ඉඩම සහ ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කළ යුතු වුවද ඊට අනුකූලව වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. ජංගම නොවන වත්කම් යටතේ සඳහන් ගොඩනැගිලි ලෙස වත්කමක් ඇතුළත්ව නොතිබිය දී ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් ලෙස එකතුව රු.1,389,856 ක අගයක් ගිණුම්ගත කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් ආයතනයේ වත්කම් නිවැරදිව පෙන්නුම් කර නොතිබුණි. | ගොඩනැගිල්ල හා ඉඩම ප්‍රග්ධනිත කර නොතිබියද සමාලෝචිත වර්ෂය තුල වරින් වර ගොඩනැගිල්ල නඩත්තු කටයුතු සිදු කරනු ලබයි. එම වියදම් පුනරාවර්තන වියදම් යටතේ පෙන්වනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පාඨමාලා ආදායම ගිණුම්ගත කිරීමේදී, සමස්ථ පාඨමාලා ගාස්තුව මත පදනම්ව විලම්භිත පාඨමාලා ආදායම සහ ලැබිය යුතු පාඨමාලා ආදායම් ගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද වර්ෂය තුළ මුදලින් ලද පාඨමාලා ආදායම විලම්භනය කර තිබීමද එක් එක් පාඨමාලාවට අදාළ වාර්ෂික වියදම වෙනම ගිණුම් තැබීම වෙනුවට විලම්භිත පාඨමාලා ආදායම් ගිණුමෙන් අඩුකර තිබුණි. | ලැබිය යුතු ආදායම සම්බන්ධයෙන් ගිණුම් තැබීම 2020 අවසන් ගිණුම් නිවැරදි කරමි.පාඨමාලා වලට අදාල ආදායම් වියදම් වෙන වෙනම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු පාඨමාලා ආදායම් නිරූපණය වන පරිදි නිවැරදි ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු ස්ථාවර තැන්පත් ආපසු ගැනීම් රු.11,100,000 ක් පමණක් වුවද ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය යටතේ එම වටිනාකම රු.6,221,448 ක් ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේ තැන්පත් ආපසු ගැනීම් රු.11,100,000 ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහයට ස්ථාවර තැන්පතු වල අඩු වීම යටතේ දක්වා ඇත.තවද, ස්ථාවර තැන්පතු වලට සෘජුව එකතුව පොලී ආදායම වන රු.4,878,551 මුදල මුදලින් ලැබී නොමැති බැවින් එම මුදල | නිවැරදි මුදල් චලනයන් පෙන්වීමට කටයුතු කළ යුතුය. |

ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පොලී ආදායමෙන් ඉවත් කරන ලදී.
එසේ නිවැරදි කිරීම් කර මූල්‍ය ප්‍රකාශය සංශෝධනය කරන ලද අතර එහි පිටපතක් විගණනයට ඉදිරිපත් කරමි.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වීමෙන් අනතුරුව වහාම පියවිය යුතු වුවද අවස්ථා 09 කදී ලබාගත් එකතුව රු.102,558 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 30 ත් දින 320 ත් අතර කාල ප්‍රමාදයක් වී තිබුණි. | විගණන අදහස් සටහන් කරගන්නා ලදී. ඉදිරියේදී හැකි ඉක්මනින් අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 11වන කොටසෙහි 15(V) උපවගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයන් විසින් පැවැත්විය යුතු පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබාගත යුතු වුවත්, ආයතනය විසින් දැනට පවත්වාගෙන යනු ලබන උපාධි පාඨමාලා 03 ක් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අදාල පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. | විශ්වවිද්‍යාල පනතට අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කළ යුතු වුවත් 2018 වසරේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම 2019 මැයි 14 වෙනි දින දක්වා ප්‍රමාද වී තිබුණු අතර 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2020 අගෝස්තු 17 දක්වා ප්‍රමාද වී තිබුණි. | 2019 මාර්තු මස 13 දිනෙන් පසුව රට තුළ උද්ගත වූ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2019 වාර්තා ලබාදීම ප්‍රමාද වීම සිදුවන ලදී. | චක්‍රලේඛ දින සටහන් නියමිත පරිදි අනුගමනය කොට ප්‍රමාද වීම් වළක්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.16,146,325 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,847,672 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,298,653 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පාරිතෝෂිත දීමනාවෙහි වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

2019 වර්ෂයේදී ජාතික විද්‍යා පදනමේ (NSF) ප්‍රදාන යටතේ පර්යේෂණ දීමනා ගෙවීම්, පුද්ගල පඩිනඩි යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් පුද්ගල පඩිනඩි 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී රු.15,293,051 කින් එනම් සියයට 96 කින් ඉහළ ගොස් තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පොත්වල සඳහන් භාණ්ඩ ප්‍රමාණයන් හා භෞතික සමීක්ෂණය අනුව තහවුරු වූ භාණ්ඩ ප්‍රමාණයන් අතර නිරීක්ෂණය වී තිබූ අයිතම 07 ක ඌනතාවය සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර වෙන්දේසි කිරීමට තීරණය කර තිබූ අයිතම 36 ක් වෙන්දේසි කිරීමටද කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව නිරීක්ෂණය වන සම්පූර්ණ ඌණතාවයන් සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව පවතී. 2019 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි සිදු කරන වෙන්දේසියේදී අදාල අයිතම 36 ද වෙන්දේසි කිරීමට කටයුතු කරනු ලැබේ. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අදාල කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ)ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 02 ක ශිෂ්‍ය ලියාපදිංචිය ධාරිතාවයෙන් සියයට 50 ක ප්‍රමාණයක් වීමෙන් සම්පත් ඌන උපයෝජනය වන බව නිරීක්ෂණය විය. | පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේදී ජාතික පුවත්පත් දැන්වීම් සහ ආයතනික වෙබ් පිටුවෙහි දැන්වීම් පලකරන අතර අයදුම්කරුවන් විභාගයකට පෙනී සිට ඉන් සමත් වන සිසුන් පමණක් සුදුසුකම් ලබති. ඒ අනුව ලියාපදිංචි වන සිසුන් ගණන පුරෝකථනය කිරීමේ හැකියාවක් නොමැත. | ආයතනික සම්පත් උපරිම උපයෝජනයට ලක් වන පරිදි මෙහෙයුම් ක්‍රියාකාරකම් වර්ධනය කරගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. |
| (ඇ)2019 දෙසැම්බර් 31 දිනට තොග ලෙජර් පරීක්ෂාව අනුව එකතුව රු.3,147,754 ක් වටිනා තොග අයිතම 225 ක් වර්ෂ 01 සිට වර්ෂ 04 ක කාලයක් දක්වා නිකුත් නොවී | මෙයින් බොහෝ භාණ්ඩ වෛද්‍ය පීඨය මගින් පරිත්‍යාග ලෙස ලැබී ඇති අතර 2016 දී පද්ධතියට ඇතුළත් කර ඇත. අධ්‍යයන කාර්ය | තොග යල්පැනීම මගින් ඇතිවිය හැකි අලාභයන් වළක්වා ගැනීමටත් |

| | | |
|---|---|---|
| පැවතීමෙන් අනවශ්‍ය තොග මිලදී ගැනීම් සහ රඳවා ගැනීම් නිරීක්ෂණය විය. | මණ්ඩලය දැනුවත් කර ආයතනයේ පර්යේෂණ සඳහා යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ. | කාර්යක්ෂම තොග මිලදී ගැනීම් ක්‍රියාවලියක් පවත්වා ගැනීමත් සිදුකළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2019 වර්ෂයේදී ඩෙක්ස්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා අනුමත වැය සීමාව රු.600,000 ක් වුවද එකතුව රු.1,681,475 ක ඩෙක්ස්ටොප් පරිගණක මිලදීගෙන තිබීමෙන් අනුමත සීමාව රු.1,081,475 කින් එනම්, සියයට 64 කින් ඉක්මවා මිලදී ගැනීම් සිදුකර තිබුණි. | ජෛව තොරතුරු තාක්ෂණ විද්‍යා පාඨමාලාව සඳහා රුපියල් 1,140,000.00 වන පරිගණක මිලදී ගෙන ඇත. එම පාඨමාලාව සඳහා ප්‍රචාරණ කටයුතු කරනු ලැබුවේ 2018 වර්ෂයේ අග භාගයේ වන අතර ශිෂයන් බඳවාගැනීම් කටයුතු 2019 වසර තුලදී සිදු කර ඇත.මෙම වියදම් උපයාගත් අරමුදලින් පියවීම සඳහා අයවැය ගත කර තිබුනි. 2018 ජුලි මාසය සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම හා නොගැලපීම ඇති වන්නේ එබැවිනි. ලියාපදිංචි වන ශිෂයන් ගණන තීරණය වූයේ 2019 ජනවාරි මාසයේදීය. | ප්‍රසම්පාදන සැලැස්ම උචිත පරිදි කාලීනව සංශෝධනය කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනයේ නියෝජ්‍ය මූල්‍යාධිකාරී ලෙස කටයුතු කරන ලද නිලධාරීනිය සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබීමෙන් එම තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත්කර තිබියදී එම තනතුර සඳහාම විශ්‍රාමික නිලධාරීනියක් කාර්ය පැවරුම් පදනම මත පත්කර ඇය වෙනුවෙන් 2019 ඔක්තෝබර් සිට 2020 ජනවාරි 15 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.237,375 ක අතිරේක වියදමක් දරා තිබුණි. | මූල්‍යමය වශයෙන් ස්වාධීන ආයතනයක් නිසා බලයලත් මූල්‍ය නිලධාරියෙකුගේ පූර්ණකාලීන සේවය අත්‍යවශ්‍ය වේ. 2019/09/09 දිනැති 178 වන කළමනාකාර මණ්ඩලය රැස්වීමේදී අංක 178.13 තීරණය පරිදි ආයතනයේ සහකාර මූල්‍යාධිකාරී තනතුරට කොන්ත්‍රාත් පදනම මත නිලධාරිනියක පත් කර ඇත .අනතුරුව 2019.10.22 දිනැති විගණන කමිටුවේ නිර්දේශය මත ඇයගේ තනතුර වැඩ පැවරුම් පදනම මත ලෙස වෙනස් කිරීමට තීරණය කර ඇත. | වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත්කර ගැනීමේ දී එම කාර්යය ඉටුකර ගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ආයතනයේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 47 ක් වන අතර 2019 වර්ෂය අවසන් වන විට ඉන් තනතුරු 06 ක පුරප්පාඩු 13 ක් සම්පූර්ණ කර නොතිබුණි. කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලද නිලධාරීන් 04 දෙනෙකුගෙන්ද, බාහිර කථිකාචාර්යවරු 21දෙනෙකුගෙන් සහ කාර්ය පැවරුම් පදනම මත බඳවා ගන්නා ලද නිලධාරීන් 09 දෙනෙකුගෙන්ද 2019 වර්ෂයේ තත්‍ය කාර්ය මණ්ඩලය සමන්විත වී තිබීමෙන් අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 04 ක් සඳහා නිලධාරීන් 21 දෙනෙකු අතිරික්ත වී තිබුණි. | පුරප්පාඩු වූ තනතුරු අතරින් අධ්‍යයන කාර්යමණ්ඩලයට අදාළව තනතුරු 03 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පමණක් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරය හිමිව ඇත. ඉතිරි පුරප්පාඩු තනතුරු 03 සඳහා අදාළ බඳවා ගැනීමේ පටිපාටීන් අනුමත කර නොතිබීම නිසා වැඩ පැවරුම් මත බඳවාගෙන ඇති නිළධාරීන් සඳහා උපයාගත් අරමුදලින් ගෙවීම් කිරීමට කටයුතු සිදුකෙරේ. අතිරික්ත ලෙස දක්වා ඇති බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම සහ ගෙවීම් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රතිපාදන යටතේ සිදුකර ඇත. | අනුමත කාර්යමණ්ඩලයට අයත් තනතුරු සඳහා වන පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |